# සමුරායි සංවර්ධනයක්

සංවර්ධනය සඳහා ජපනුන්ට ආවේණික වූ වෙනම ක්‍රමයක් වෙයි ද? අද පවතින බටහිර නූතනත්වය අප සියලාලන්ට ම ගැලපෙයි ද ආදී ප්‍රශ්න විචාරයට ලක්කරන පොතක් පිළිබඳ විවේචනයක් පසුගිය ඉරිදා ඉංගිරිසි පුවත්පතක පළවිණි. පොත ලියා ඇත්තේ ජපන් ජාතික ගණිත මහාචාර්යවරයෙකි. ඔහු නමින් මාසහිකෝ ෆුජිවාරා වෙයි. විවේචනය ඇමරිකන් ජාතික ඉතිහාසය හා ජාත්‍යන්තර සම්බන්ධතා මහාචාර්යවරයකු වූ හැරල්ඩ් ජේම්ස් ගෙනි. පොත තවම වෙනත් බසකට පරිවර්තනය කෙරී නැත. එසේ වුවත් එහි ඇති අදහස් අද ම බිඳ දැමීම ජේම්ස් මහතාගේ අභිප්‍රාය වෙයි.

මාසහිකෝ ෆුජිවාරා මතුකරන අදහස් බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට පටහැණි වෙයි. ඒ අදහස් තහවුරු වීම බටහිර නූතනත්වයට අහිතකර ය. එබැවින් ඉංගිරිසි හෝ වෙනත් භාෂාවකට පරිවර්තනය වීමට මත්තෙන් වුව ද ඒ පිළිබඳ විවේචනයක් පළකිරීම බටහිර ක්‍රිස්තියානි නූතනත්වය පැත්තෙන් බැලූ කල වැදගත් වෙයි. ෆුජිවාරා මහතාට අනුව ජපනුන් සංවර්ධනය සඳහා වෙනත් ක්‍රමයක් තිබිය යුතු ය. ඔහු කියන පරිදි ජපානයේ ක්‍රිස්තියානිය හෝ ඉස්ලාම් හෝ වැනි ආගමක් නැත. ජේම්ස් මහතාට අනුව එලෙස ආගම ඈඳගැනීම වැරදි ය. කෙසේ වෙතත් ඔහුට අනුව ෆුජිවාරා මහතාගේ පොතෙන් පැරණි විවාදයක් නැවතත් කරළියට පැමිණෙයි. ධනවාදය පවත්වාගෙන යෑම සඳහා අවශ්‍ය වූ සාරධර්ම (වැලියුස්)කවරේ ද යන්න ඒ විවාදයෙහි තේමාව වෙයි.

ජේම්ස් මහතා පෙන්වා දෙන්නේ ඇතැම් චින්තකයන්ට, විශේෂයෙන් ම මැක්ස් වෙබර් නම් සමාජ විද්‍යාඥයාට, අනුව ධනවාදය පවත්වාගෙන යෑමට බාහිරින් ගෙනෙන ආචාරධර්ම පද්ධතියක් අවශ්‍ය වෙයි. වෙබර් මහතා කියා ඇත්තේ ධනවාදයට ප්‍රොතෙස්තන්ත ආචාරාරධර්ම අවශ්‍ය බව ය. වෙනත් වචනවලින් කිවහොත් ධනවාදය පදනම්වන්නේ ප්‍රොතෙස්තන්ත ආචාරධර්ම (එතික්ස්) මත බව වෙබර් මහතාගේ අදහස ය. එහෙත් මේ මතය වැරදි බව බොහෝ බටහිර උගතුන් විසින් පෙන්වා දෙනු ලැබ ඇති බව ජේම්ස් මහතා සඳහන් කරයි. මේ මතවල නිරවද්‍යතාව කෙසේ වෙතත් ෆුජිවාරා මහතා කියා ඇතැයි ජේම්ස් මහතා කියන දෙය ලංකාවේ අපට ඉතා වැදගත් වෙයි. දැනට අවුරුදු විස්සක පමණ කාලයක් තිස්සේ අප සාකච්ඡාකරන දෙයින් එක් කොටසක් පමණක් ෆුජිවාරා මහතා කියා ඇති බව බැලූ බැල්මට පෙනී යයි. ෆුජිවාරා මහතාගේ පොත තවමත් ඉංගිරිසි බසට පරිවර්තනය කෙරී නොමැති බැවින් මේ පිළිබඳ නිශ්චිත මතයක් ප්‍රකාශකිරීමේ අපහසුවක් ඇති නමුත් ඔහු කියන්නේ මෙරට දිවයින පාඨකයනට හුරු පුරුදු දේ බව පැහැදිලි ය.

බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ ඊනියා සංවර්ධනය වෙනුවට වෙනත් සංවර්ධනයක් ආර්ථිකයක් අපට තිබිය යුතු බව අප ප්‍රකාශකර ඇත්තේ එයට වඩා පුළුල් ප්‍රශ්නයක කොටසක් ලෙස ය. අප පෙන්වා දී ඇත්තේ මූලික වශයෙන් ගත්කල දැනුම යනු නිර්මාණයක් බවත් (ඒ සමාජ නිර්මිතයක් යැයි ඇතැම් බටහිර සමාජ විද්‍යාඥයෝ කියති) ඒ මිනිසාගේ ඉන්ද්‍රිය පද්ධතියට, මනසට හා සංස්කෘතියට සාපේක්ෂව නිර්මාණය වන බවත් ය. බටහිර සමාජ විද්‍යාඥයන් සමාජ නිර්මිතයක් ලෙස දැනුම ගැන සඳහන් කරන විට එවැන්නක් නොකියැවෙන බව අවධාරණය කළ යුතු ය. සංවර්ධනය පිළිබඳ දැනුම ද එලෙස ඒ ඒ සංස්කෘතියට සාපේක්ෂව නිර්මාණය වන්නකි. මෙහි දී අපි චින්තනය යන සංකල්පය නිර්මාණය කෙළෙමු. චින්තනය යන සංකල්පය ගුණදාස අමරසේකර මහතා ජාතික චින්තනය යන්නෙන් මුලින් ම අදහස්කළ දෙයට වඩා වෙනස් වෙයි. චින්තනය යනු සමාජයක ජීවත්වන්නවුන්ගේ කලාශිල්ප, සංගීතය, සාහිත්‍යය, විද්‍යාව, දර්ශනය, වෛද්‍ය ක්‍රමය, තාක්ෂණය පමණක් නොව ආහාරපාන ඇඳුම් පැලඳුම් ආදිය ද එකට බැඳ තබන හුයක් ලෙස සැලකිය හැකි ය. ඒ සමස්තය පිළිබඳ වූ සංකල්පයකි. දැනුමෙහි පදනමෙහි ඇත්තේ චින්තනය ය. බටහිර කලාශිල්ප ආදිය නිර්මාණය වී ඇත්තේ මෙයට අවුරුදු පන්සියයකට පමණ පෙර ඊනියා පුනරුදය සමග බිහිවූ ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය මත පදනම් වී ය. මුළු මහත් බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි ම ආරම්භයෙහි ඇත්තේ ඊනියා පුනරුදය ය.

මගේ විශ්වාසය බටහිර ක්‍රිස්තියානි නූතනත්වය (බටහිර පශ්චාත්නූතනවාදීන් කෙතෙක් කෑමොර ගැසුව ද ඊනියා පශ්චාත්නූතනත්වය යනුවෙන් හැඳින්වෙන්නේ ක්‍රිස්තියානි නූතනත්වයෙහි ම වර්ධනයක් පමණකි. මෙරට අනුකාරක රැළ කරන්නේ වැමෑරීම පමණකි.) මිනිස් වර්ගයාටම විනාශය ළඟාකර දෙන බව ය. ඒ අපට පමණක් නොව

© Prof. Nalin De Silva

බටහිරයන්ට ද විපත්තිදායක ය. අප අපේ සංවර්ධනයක් ගැන පමණක් නොව අපේ දැනුමක් ගැන ද සිතිය යුතු ය. සංවර්ධනය ද අවසාන වශයෙන් ගත්කල සංවර්ධනය පිළිබඳ දැනුම මත පදනම් වෙයි. ඒ අරුතින් ගත්කල ෆුජිවාරා මහතා පවසන්නේ අප දිවයින, විදුසර හා දි අයිලන්ඩ් පුවත්පත් ඔස්සේ සාකච්ඡාකර ඇති කරුණුවලින් කොටසක් පමණක් බව පෙනී යයි. එහෙත් මෙරට සිටින බක පණ්ඩිතයන්ට අනුව අපි අතීතකාමී ළිංමැඩියෝ පමණක් වෙමු.

ෆුජිවාරා මහතා අතීතකාමියෙක් ද? ඔහු එක්තරා ආකාරයකින් ගතහොත් ජපානයේ පැරණි සමුරායි සංස්කෘතිය මත පදනම් වූ සංවර්ධනයක් ගැන කතාකරන බව පෙනී යයි. ජපානයේ ඉතා වැඩි පිරිසක් බටහිර අනුකරණයට පෙළඹී බටහිර දේශපාලන හා සංස්කෘතික ආධිපත්‍යය ඉදිරියේ නිවට ව දණගසා සිටිය දී ෆුජිවාරා මහතා වැන්නන් ද එහි සිටින බව දැනගන්නට ලැබීම ම සතුටකි. ජපානයේ පැරණි චින්තනය සමුරායි චින්තනය ලෙස හැඳින්වුවහොත් ෆුජිවාරා මහතා කියන්නේ ඒ චින්තනය මත පදනම් වී ජපන් ජාතිකයන් වෙනත් සංවර්ධනයක් ගැන සිතා බැලිය යුතු බව පෙනෙයි. අප ඒ මහතාට කියන්නේ ඒ සංවර්ධනයට පමණක් සීමානොකරගත යුතු බවත් ජපන් ජාතිකයන් සමුරායි චින්තනය මත පදනම් වී තමන්ගේ ම වූ දැනුමක් නිර්මාණය කරගත යුතු බවත් ය. බටහිර දෙසට ජපානයේ කවුළු විවෘතකර ආරම්භ වූ නව ජපන් සංස්කෘතියට තිත තැබීමට තව තවත් බලා සිටිය යුතු නො වෙයි.

අපි දැන් ජේම්ස් මහතා කියන ආගමේ පටලැවිල්ල කෙටියෙන් සාකච්ඡාකරමු. ෆුජිවාරා මහතා ජපානයේ ආගම ක්‍රිස්තියානි හෝ මුස්ලිම් හෝ නොවන බව සඳහන්කරමින් කියන්නේ ජපානයේ සංවර්ධනය එරට ආගම මත පදනම්විය යුතු බව විය හැකි ය. අපට ෆුජිවාරා මහතාගේ පොත නොකියවා ඒ පිළිබඳ ව නිශ්චිත යමක් නොකිවහැකි නමුත් මේ සම්බන්ධයෙන් වෙබර් මහතා ධනවාදය හා ප්‍රොතෙස්තන්ත ආචාර ධර්ම (කැපිටලිසම් ඇන්ඩ් ප්‍රොටෙස්ටන්ට් එතික්ස්) පොතෙන් කියා ඇති දේ සාකච්ඡාකළ හැකි ය. වෙබර් මහතා වරද්දාගන්නේ ප්‍රොතෙස්තන්ත ආචාර ධර්ම ධනවාදයට පිටින් වූ දැනුමක් ලෙස සැලකීමෙන් ය. ඔහුට අනුව ආර්ථිකය එක් පතෙකය. ආචාර ධර්ම තවත් පසෙක ය. ඔහු ඒ දැ පද්ධතියක එකිනෙකින් වෙන් වූ කොටස් ලෙස සලකයි. ධනවාදයට අවශ්‍ය වූ ආචාර ධර්ම ප්‍රෙතෙස්තන්ත ආගමෙන් සැපයෙන්නේ ය යනු ඔහුගේ මතය විය.

එහෙත් පද්ධතියක් ලෙස ගත්කල ආර්ථිකය හා ආචාර ධර්ම (හා අනෙක් දෑ) එලෙස එකිනෙකින් වෙන්කළ හැකි නො වෙයි. බටහිර ඊනියා පුනරුදයෙන් ආරම්භ වූ ක්‍රිස්තියානි නූතනත්වයෙහි එසේ වෙන්කෙරෙන්නේ එහි දැනුම ගැන ඇත්තේ එවැනි ආකල්පයක් වන බැවිනි. මේ කරුණ නිව්ටෝනීය යාන්ත්‍රිකයේ (නිව්ටෝනියන් මිකැනික්ස්) පදනම සමග ද බැඳී ඇත. නිව්ටෝනීය පද්ධතියක් යනු කොටස්වල එකතුවක් මිස එකට බද්ධ වූ, අනුකලනය වූ, යමක් නො වෙයි. මෝටර් රථයක එක් කොටසක් වෙනුවට වෙනත් කොටසක් යොදන්නේ ඒ නිව්ටෝනීය පද්ධතියක් ලෙස සැලකීමෙන් ය. ආර්ථිකය හා ආචාර ධර්ම එලෙස නො වෙයි. ආර්ථිකයක් ඇතිවන්නේ ම ආචාර ධර්ම පද්ධතියක් සමග බැඳීමෙනි. අනෙක් අතට ආගමක් ද බිහිවන්නේ යම් සංස්කෘතියක ය. බුදු දහම ද බිහි වී ඇත්තේ දඹදිව පැරණි අනාර්ය (ද්‍රවිඩ නොවන බව මැටිටන්ට හා පුස්සන්ට අවධාරණය කළ යුතු ය.) සංස්කෘතියෙහි හා චින්තනයෙහි ය. වෙබර් මහතා ධනවාදයෙහි ආචාර ධර්ම පද්ධතිය ප්‍රෙතෙස්තන්ත යැයි කියන විට ඔහු ඉන් අදහස් කරන්නේ ආගමක් නමුත් ඒ සංස්කෘතියක් ලෙස නිවැරදි විය යුතු ය. ප්‍රොතෙස්තන්ත ආගම ද බිහි වී ඇත්තේ බටහිර ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි (ප්‍රොතෙස්තන්ත) චින්තනයෙහි ය. අනෙක් අතට ඒ මහතා කරන වැරැද්ද නම් ආර්ථිකය හා ආචාර ධර්ම වෙන්කිරීම ය. නිව්ටෝනීය සුසමාදර්ශයක (පැරඩයිම්) කටයුතු කළ ඒ මහතා එසේ කිරීම පුදුමයක් නොවේ. ධනවාදී ආර්ථිකය එලෙසම තබාගෙන අපට ප්‍රෙතෙස්තන්ත නොවන ආචාර ධර්ම පද්ධතියක් එයට යාකළ හැකි නොවේ. මෙරට බෞද්ධ යැයි කියාගන්නා ඇතැමුන් ද ධනවාදී ආර්ථිකයට බෞද්ධ ආචාර ධර්ම එකතුකිරීමට සූදානම්වන්නේ නිව්ටන්වාදීන් ලෙස මිස බෞද්ධයන් ලෙස නොවේ. අප චින්තනය යන සංකල්පය නිර්මාණය කරගත්තේ එක් අතකින් නිර්නිව්ටෝනීය පද්ධතීන් ගැන කතාකිරීමට ය. අප කළ යුත්තේ ධනවාදයට අතනින් මෙතනින් ආචාර ධර්ම යා කිරීම නොව සිංහල බෞද්ධ චින්තනය මත පදනම් වී නව ආර්ථිකයක් ගොඩනගා ගැනීම ය. ෆුජිවාරා මහතා ඇතුළු පිරිස සමුරායි චින්තයෙහි නව ආර්ථිකයක් හා සංවර්ධනයක් ගොඩනගනු දැකීමට අපි කැමැත්තෙමු.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva